සියලු ම හිමිකම් ඇවිරිණි.

SRI LANKA

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## අදියර II විභාගය - 2025 ජනවාරි

## (203) ව්‍යාපාර නීතිය

(Business Law)

2025-02-01
පස්වරු
[01.45 – 05.00]

පිටු ගණන : 07
ප්‍රශ්න ගණන: 07

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
*උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*

(2) ***සියලුම ප්‍රශ්නවලට උත්තර සැපයිය යුතු වේ.***

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

(6) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

(මුළු ලකුණු 25)

### 01 වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.6 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමඟ ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** පහත සඳහන් අධිකරණ අතුරෙන්, මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් අධිකරණ බලය පවතින්නේ කුමන අධිකරණයට ද?

(1) ශ්‍රේෂ්ඨාධිකරණය. (2) දිස්ත්‍රික් අධිකරණය.
(3) මහාධිකරණය. (4) අභියාචනාධිකරණය.

**1.2** පහත සඳහන් ඒවා අතුරෙන්, භාණ්ඩ විකිණීමේ ආඥා පනතට අනුව ගැනුම්කරුවෙකුට හිමි ප්‍රතිකර්මයක් වන්නේ කුමක් ද?

(1) ලියමේ බලය (Right of lien). (2) නැවත විකිණීමේ බලය.
(3) භාර නොගැනීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම. (4) නියත ඉටුකිරීමේ ආඥාවක් ලබා ගැනීම.

**1.3** පහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ ඇති නීති මූලාශ්‍රයක් වන්නේ කුමක් ද?

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව. (2) සිරිත් (Customs).
(3) අධිකරණ පූර්ව නිදර්ශන (නඩු තීන්දු). (4) ඉහත සඳහන් සියල්ලම.

**1.4** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ [Board of Investment (BOI)] පහත සඳහන් මූලික කාර්යයන් ඔබ වෙත ලබා දී ඇත:

**(a)** ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම.

**(b)** ව්‍යාපෘති යෝජනා සම්බන්ධයෙන් ආයෝජකයින් සමඟ සාකච්ඡා කිරීම.

**(c)** බදු සහ අනෙකුත් සහන ලබාදීම.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සම්බන්ධයෙන් වන නිවැරදි කාර්යය / කාර්යයන් වන්නේ:

(1) **(a)** පමණි.
(2) **(b)** පමණි.
(3) **(a)** සහ **(b)** පමණි.
(4) **(b)** සහ **(c)** පමණි.

**1.5** පහත සඳහන් ඒවා අතුරෙන්, ගනුදෙනු කළ හැකි ලියවිල්ලක් වන්නේ කුමක් ද?

(1) ණයවර ලිපිය.
(2) නෞභාර පත.
(3) පොරොන්දු නෝට්ටු.
(4) ස්ථාවර තැන්පතු සහතික.

**1.6** ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත වන පහත සඳහන් ලියවිලි සලකා බලන්න:

**(a)** රක්ෂණ සහතිකය.

**(b)** නෞභාර පත.

**(c)** ඉන්වොයිසිය.

ඉහත සඳහන් ඒවා අතුරෙන්, මිල, රක්ෂණය, ගැල් කුලිය (CIF) ගිවිසුමක් යටතේ විකිණුම්කරු විසින් ගැනුම්කරු වෙත ඉදිරිපත් කරන ලියවිල්ල / ලියවිලි වන්නේ:

(1) **(a)** පමණි.
(2) **(a)** සහ **(b)** පමණි.
(3) **(b)** සහ **(c)** පමණි.
(4) ඉහත සඳහන් සියල්ලම.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 12)

*අංක 1.7 සිට 1.9 දක්වා ප්‍රශ්නවල දී ඇති එක් එක් ප්‍රකාශය* ***සත්‍ය*** *හෝ* ***අසත්‍යදැයි*** *දක්වන්න.* ***සත්‍ය*** *හෝ* ***අසත්‍ය*** *යන උත්තරය ප්‍රශ්න අංකය සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.7** විනිමය බිල්පත් ආඥා පනතට අනුව, බිල්පත නියමිත පරිදි ගෙවීම සඳහා ඉදිරිපත් කළ විට බිල ගෙවීම සම්බන්ධයෙන් පිටසන්කරු වගකීමට බැඳී සිටී.

**1.8** නියෝජිතයෙකුට ලබා දී ඇති අධිකාරිය ලිඛිතව පමණක් ප්‍රකාශ කරනු ලැබේ.

**1.9** නැව තෙක් නොමිලේ [Free on Board (FOB)] ගිවිසුමක, විකුණුම්කරු විසින් ගැනුම්කරුට භාණ්ඩ ලැබෙන තෙක් වන ප්‍රවාහන ගාස්තු, පැටවීමේ ගාස්තු සහ අපනයන බදු දැරිය යුතුය.

(එකකට ලකුණු 01 බැගින්, ලකුණු 03)

*අංක 1.10 සිට 1.14 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර, ප්‍රශ්න අංක ද සමඟ, ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.10** 2007 අංක 24 දරණ පරිගණක අපරාධ පනත යටතේ හඳුනාගෙන ඇති ප්‍රධාන වැරදි දෙකක්(02) සඳහන් කරන්න.

**1.11** හිස් පිටසනක් යනුවෙන් අදහස් වන්නේ කුමක්ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

**1.12** භාණ්ඩ විකිණීමේ ගිවිසුමක, මිල තීරණය කරන ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

**1.13** විනිමය බිල්පතක් අවසානයට පත්වන ආකාර දෙකක්(02) සඳහන් කරන්න.

**1.14** ජාත්‍යන්තර වෙළඳාමේදී භාවිත කරන ගෙවීම් ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න.

(එකකට ලකුණු 02 බැගින්, ලකුණු 10)
(මුළු ලකුණු 25)

*A කොටසෙහි අවසානය*

## B කොටස

(මුළු ලකුණු 50)

### 02 වන ප්‍රශ්නය

**රවිනි** තම ව්‍යාපාරය සඳහා **සිල්වාගෙන්** රු. මිලියන 2 ක් වටිනා භාණ්ඩ ණයට ලබා ගන්නා ලදී. රට තුළ ඇති අයහපත් ආර්ථික තත්ත්වය හේතුවෙන්, **රවිනිගේ** ව්‍යාපාරයේ පිරිවැටුම අඩු වූ අතර, ඇයගේ ණය පියවීම සඳහා වසරක කාලයක් ලබාදෙන ලෙස **සිල්වාගෙන්** ඉල්ලා සිටින ලදී. **සිල්වා, රවිනිගේ** ජීවිතය සම්බන්ධයෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබාගැනීමේ පදනම යටතේ **රවිනිගේ** ඉල්ලීම සළකා බලන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **රවිනිගේ** ජීවිතය පිළිබඳ රක්ෂණ ඔප්පුවක් **සිල්වාට** ලබාගත හැකිද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 04)

(b) පහත සඳහන් රක්ෂණ මූලධර්ම **පැහැදිලි කරන්න**:

(i) උපරිම විශ්වාසය (Utmost Good Faith). (ලකුණු 03)

(ii) ආසන්නතම හේතුව (Proximate Cause). (ලකුණු 03)

(මුළු ලකුණු 10)

### 03 වන ප්‍රශ්නය

"බුද්ධිමය දේපළ නීතිය තුළ, වාණිජ කටයුතුවලදී භාවිත කරන නව නිපැයුම්, මෝස්තර, සංකේත සහ ජායාරූප ඇතුළු මනසින් බිහිවන නිර්මාණ ආරක්ෂා කරනු ලබන විවිධ නෛතික අයිතිවාසිකම් ඇතුලත් වේ. නවෝත්පාදන සහ නිර්මාණශීලීත්වය දිරිමත් කිරීමේදී මෙම අයිතීන් ඉතා වැදගත් වේ."

තවද, මුදල් විශුද්ධිකරණ ක්‍රියාකාරකම්වලට එරෙහිව සටන් කිරීමට සහ වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සැපයීම සඳහා රජය විසින් 2006 අංක 05 දරණ මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනත ද හඳුන්වා දී ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ලියාපදිංචි වෙළෙඳ සලකුණක (trade mark) හිමිකරුට හිමි අයිතිවාසිකම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) 2003 අංක 36 දරණ බුද්ධිමය දේපළ පනතට අනුව පේටන්ට් අයිතිය හිමි නොවන නව නිපැයුම් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(c) මුදල් විශුද්ධිකරණ වැළැක්වීමේ පනතට අනුව නීති විරෝධී කටයුතු හතරක්(04) **සඳහන් කරන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 04 වන ප්‍රශ්නය

ප්‍රසිද්ධ සපත්තු නිෂ්පාදකයෙකු වන **තවීන්**, නගරය තුළ සාප්පුවක් පවත්වාගෙන යන අතර, ඔහු විවිධ වර්ගයේ සපත්තු අලෙවි කරනු ලබයි. නිත්‍ය පාරිභෝගිකයෙකු වන **මනීෂා**, ප්‍රමාණය 8 වන සපත්තු යුගලයක් **තවීන්ගෙන්** විශේෂයෙන්ම ඉල්ලා සිටින ලදී. සපත්තු පිළිබඳ හොඳින්ම දන්නා **තවීන්**, **මනීෂා** මිලදී ගනු ලබන්නේ ප්‍රමාණය 8 වන සපත්තු යුගලක් බව තහවුරු කරන ලදී. **මනීෂා** සපත්තු මිලදී ගත් අතර, ඒවා නිවසේදී පැළඳීමෙන් පසු ඒවායේ සත්‍ය ප්‍රමාණය 9 ලෙස අවබෝධ විය. **මනීෂා**, **තවීන්ව** සම්බන්ධ කරගත් අතර, එම කාණ්ඩයේ සියලුම සපත්තුවල ප්‍රමාණය 8 බවත්, කිසිදු වරදක් සිදුවී නොමැති බවටත් ඔහු විසින් අවධාරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) **තවීන්ට** එරෙහිව **මනීෂාගේ** ඇති නීතිමය අයිතිවාසිකම් **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ ඇති ව්‍යංග කොන්දේසි (implied conditions) හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 05 වන ප්‍රශ්නය

**නුවන්** ට වෙළෙඳ ප්‍රචාරණ ආයතනයක් හිමි අතර, මහ මැතිවරණයට තරඟ කිරීමට යන දේශපාලඥයෙකු සඳහා නව තේමා ගීතයක් නිර්මාණය කිරීමට **රුකාව** බඳවාගෙන ඇත. **රුකා** නිදහස් සංගීතවේදියෙක් වන අතර, විවිධ සේවාදායකයින් සඳහා විවිධ ව්‍යාපෘතිවල වැඩකරනු ලබයි. නිශ්චිත අවශ්‍යතා සහ නියමිත කාලසීමාව ඇතුළුව ගීතය පිළිබඳ කෙටි විස්තරයක් **නුවන්** විසින් **රුකාට** සපයන ලදී. **රුකා** හට ඔහුගේ වැඩකරන වේලාවන් තෝරා ගැනීමට නිදහස දී තිබූ අතර, ගීත රචනා කිරීමේ කාර්යය සම්පූර්ණ කිරීමට ඔහුගේම උපකරණ සහ මෘදුකාංග භාවිත කරනු ලැබිය. **රුකා** විසින් තේමා ගීතය **නුවන්ට** ලබා දුන් අතර, ව්‍යාපෘතිය සඳහා **රුකාට** ස්ථාවර ගාස්තුවක් ගෙවන ලදී.

මාස කිපයකට පසුව, **නුවන්** තවත් ගීත නිර්මාණය කිරීම **රුකාට** පිරිනැමීමට තීරණය කළ අතර, ඉදිරි මාස හය සඳහා **රුකා**, **නුවන්** වෙනුවෙන් පමණක් වැඩ කළ යුතු යැයි යෝජනා කරන ලදී. **රුකා**, **නුවන්** විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ මාලාවක් අනුගමනය කිරීම, **නුවන්ගේ** චිත්‍රාගාර උපකරණ භාවිත කිරීම සහ සතිපතා ප්‍රගතිය **නුවන්ට** වාර්තා කිරීම කළ යුතු බවත් **නුවන්** විසින් යෝජනා කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) කම්කරු නීතිය යටතේ **රුකා**, සේවකයෙකු ද නැතහොත් ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු ද ලෙස වර්ගීකරණය කරන්නේද යන්න **පැහැදිලි කරන්න**. (ලකුණු 07)

(b) 1980 අංක 46 දරණ සේවක භාර අරමුදල් [Employees' Trust Fund (ETF)] පනත අනුව, සේවක භාර අරමුදලේ ප්‍රධාන කාර්යයන් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**සීමාසහිත Island Machinery සමාගම**, 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2017 වර්ෂයේදී සංස්ථාපනය කරන ලද සමාගමකි. **සීමාසහිත Island Machinery සමාගමේ** සාංගමික ව්‍යවස්ථාවලියට අනුව සමාගමේ මූලික අරමුණ වන්නේ කාර්මික යන්ත්‍රෝපකරණ නිෂ්පාදනය, අලෙවිකරණය, බෙදාහැරීම ඇතුළුව එම යන්ත්‍ර නිෂ්පාදනය හා විකිණීම වේ.

**සීමාසහිත Island Machinery සමාගමේ** සාමාජිකයින් අතර, ඇති වන ඕනෑම ආරවුලක්, බේරුම්කරණයන් හරහා විසඳිය යුතු බවට වගන්තියක් එහි සාංගමික ව්‍යවස්ථාවලියේ අඩංගු වේ.

මෑත කාලීන ගෝලීය ආර්ථික පසුබෑම නිසා ඇති වූ ආර්ථික අභියෝගවලට ප්‍රතිචාර වශයෙන්, **සීමාසහිත Island Machinery සමාගමේ** අධ්‍යක්ෂවරයෙකු වන **අනිල්** විසින් මුල්‍ය පහසුකමක් යටතේ වැඩිදියුණු කළ වාණිජ කෝපි යන්ත්‍ර හතරක්, එකක් ඇමරිකානු ඩොලර් (US $) 50,000 බැගින් මිලට ගැනීමට යෝජනා කරන ලදී. මෙම කෝපි යන්ත්‍ර, කෝපි අලෙවිසැල් සඳහා කල්බදු පහසුකම් යටතේ ලබා දී කුලී ආදායමක් උපයා ගැනීමට ඔහු යෝජනා කරන ලදී. මෙම කරුණු සලකමින් සමාගම, කෝපි යන්ත්‍ර හතරක් මිලදී ගත්තා ලදී.

**සීමාසහිත Island Machinery සමාගමේ** ප්‍රධාන කොටස්හිමියෙකු වන **චන්ද්‍රා** මෙම යෝජනාවට එකඟ නොවූ අතර, සමාගමට එරෙහිව නීතිමය කටයුතු ආරම්භ කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ:**

(a) ඉහත සිද්ධියට අදාළව, **සීමාසහිත Island Machinery සමාගමේ** සාංගමික ව්‍යවස්ථාවලියේ වලංගුභාවය **විමසන්න**. (ලකුණු 07)

(b) **සීමාසහිත Island Machinery සමාගමේ** අධ්‍යක්ෂවරයෙකුගේ යුතුකම් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

## C කොටස

(මුළු ලකුණු 25)

### 07 වන ප්‍රශ්නය

(A) **සංජය** විසින් **GreenTech** නමින් ව්‍යාපාරයක් රත්නපුර ප්‍රදේශයේ පවත්වාගෙන යයි. ඔහුගේ ව්‍යාපාරය, පරිසර හිතකාමී උණ බම්බු ආශ්‍රිත ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට විශේෂඥතාවයක් දරණු ලබයි. ජනවාරි 8 දින, නුවර එළිය ප්‍රදේශයේ ජීවත්වන උණ බම්බු සැපයුම්කරුවෙකු වන **ප්‍රියන්ත** දුරකතනයෙන් සම්බන්ධ කරගත් **සංජය**, උණ බම්බු කිලෝග්‍රෑම් 500 ක් කිලෝග්‍රෑමයක් රු.5,000/- බැගින් මිලදී ගැනීමට අර්පණයක් ඉදිරිපත් කරන ලදී. රත්නපුර පිහිටි **සංජයගේ** කාර්යාලයට ලිපියක් තැපෑලෙන් එවා මෙම අර්පණය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම දන්වා එවන ලෙස ඔහු විසින් **ප්‍රියන්තගෙන්** ඉල්ලා සිටින ලදී. ජනවාරි 10 දින උදෑසන **ප්‍රියන්ත** විසින් මෙම අර්පණය පිළිගනිමින් ලිපියක් තැපැල් කළ අතර, එය **සංජයගේ** කාර්යාලයට ජනවාරි 13 දින ලැබී තිබුණි. මේ අතර, වෙනත් උණ බම්බු සැපයුම්කරුවෙකු වන **රමේෂ්** හට **සංජයගේ** මෙම අර්පණය දැන ගන්නට ලැබුණු අතර, ඔහු එය පිළිගැනීමට තීරණය කරන ලදී. ජනවාරි 10 දින සවස, **රමේෂ්** විසින් **සංජය** මුණ ගැසුනු අතර, උණ බම්බු කිලෝග්‍රෑම් 500 ක් කිලෝග්‍රෑමයක් රු.4,500/- ක අඩුකළ මිලකට සැපයීමට එකඟ විය. ඉල්ලුම් කළ පරිදි **රමේෂ්** විසින් උණ බම්බු තොගය සපයනු ලැබිණි. ඉන්පසු **සංජය** විසින් **රමේෂ්** සමඟ ඇති කරගත් ගිවිසුම හෙළිදරව් කළ අතර, **ප්‍රියන්තගේ** උණ බම්බු ප්‍රතික්ෂේප කරන ලදී. මේ වනවිට **ප්‍රියන්ත**, **සංජයට** එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග පිළිබඳ සලකා බලමින් සිටී.

මීට අමතරව, ඔහුගේ උණ බම්බු සැකසීමේදී ලබාගන්නා සාරය, විශේෂ වර්ගයේ ඇසුරුමක් සෑදීමට භාවිතකළ හැකි බව **සංජය** සොයාගත් අතර, ඔහු එය "**EcoWrap**" ලෙස නම් කරන ලදී. ඔහු මෙම නිෂ්පාදනය සමඟ ත්‍යාගයක් ලබාදෙන බවට ප්‍රචාරණ කටයුතු සිදු කරන ලදී.

***"EcoWrap භාවිතය නිසා වන අලාභ වෙනුවෙන් වන්දි ඉල්ලනු ලබන ඕනෑම පුද්ගලයෙකු සඳහා***

***රු.100,000 /- ක ත්‍යාගයක්.***

***ඔබ විසින් නිසි පරිදි උපදෙස් පිළිපදිනු ඇතැයි බලාපොරොත්තු වේ."***

ඇසුරුම් නිර්මාණකරුවෙකු වන **කුමාර**, **GreenTech** වෙතින් **EcoWrap** මිලදීගෙන එය **GreenTech** වෙතින් සපයන ලද උපදෙස් අනුව කාබනික නිෂ්පාදන ඇසුරුම් නිර්මාණයට භාවිත කරන ලදී. අවාසනාවන්ත ලෙස සතියක් තුල මෙම ඇසුරුම් ගැලවී යාම නිසා භාණ්ඩවලට හානි සිදු විය.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) **සංජයගේ** දුරකතන ඇමතුම මගින් **ප්‍රියන්ත** වෙත වලංගු අර්පණයක් සිදුවුයේද යන්න **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(b) **සංජයට** එරෙහිව **ප්‍රියන්තට**, නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිද යන්න **විමසන්න.** (ලකුණු 06)

(c) **සංජයට** එරෙහිව **කුමාරට** නීතිමය ක්‍රියාමාර්ග ගත හැකිද යන්න **විමසන්න.** (ලකුණු 06)

(B) **රජීව්** වතු හිමියෙක් වන අතර, ඔහු **සමත්** හට ලිපියක් මාර්ගයෙන් ඔහු වසරක කාලයක් සඳහා විදේශ ගතවන බව දන්වන ලදී. මෙම කාලසීමාව තුළදී **සමත්** විසින් තම වත්ත කළමනාකරණය කරමින් සියළු හිඟ ගෙවීම් එකතු කර ගැනීමත්, වත්ත කළමනාකරණය කර ගැනීමත් සිදුකරනු ඇතැයි **රජීව්** බලාපොරොත්තු විය. **රජීව්** විසින් වත්තට අදාල තොරතුරු සහ පැන නගින ප්‍රශ්න පිළිබඳව නිරන්තරයෙන් ඔහුව දැනුවත් කරන ලෙස **සමත්ට** උපදෙස් ලබාදෙන ලදී. මීට අමතරව, **රජීව්, සමත්** විසින් ණය පදනමට කිසිදු මිලදී ගැනීමක් සිදු කිරීම පැහැදිලිවම තහනම් කරන ලදී.

අනතුරුව, **සමත්, රජීව්** හමුවී වත්තට අදාල ලියකියවිලි සහ යතුරු ලබාගන්නා ලදී. තහනම නොතකා **සමත්** විසින් වත්තේ මෙහෙයුම්වලට අවශ්‍ය සැපයුම් ද්‍රව්‍ය **නිමල්ගෙන්** ණයට මිලදී ගන්නා ලදී. **සමත්** විසින් වත්තේ කොටසක එළවළු පාත්තියක්ද සකසන ලද අතර, මෙමගින් ආසන්න වශයෙන් මසකට රු.120,000/- ක ආදායමක් උපයාගත් අතර, මේ පිළිබඳව **රජීව්** දැනුවත් නොකරන ලදී.

තවදුරටත් කටයුතු අවුල් වියවුල් කරමින් **සමත්, රජීව්ට** නොදන්වා තම වගකීම් කීපයක් එම ප්‍රදේශයේ පදිංචි **කමල්** වෙත පවරන ලදී. **කමල්** තම කැමැත්ත මත ක්‍රියාකරමින්, වත්තේ නඩත්තු කටයුතු සඳහා **නිමල්ගෙන්** ණය පදනමට අමතර මිලදී ගැනීම් සිදුකරන ලදී.

අවසානයේදී **රජීව්** වත්ත පිළිබඳ තොරතුරු දැනගැනීමෙන් පසු **සමත්ගෙන්** ප්‍රශ්න කරන ලද අතර, ඔහු අවධාරණය කරනු ලැබුවේ **නිමල්ට** ගෙවිය යුතු මුදල නොගෙවිය යුතු බවත්, **සමත්ට** ණයට බඩු මිලදී ගැනීමට බලයක් නොමැති බවත්ය. **කමල්ට** අනවසරයෙන් රාජකාරී පැවරීම පිළිබඳව **රජීව්** කනස්සල්ලට පත්විය.

**ඔබ විසින් කල යුතු දෑ:**

(a) **සමත්** විසින් **රජීව්** හට ඔහුගේ නියෝජිතයා වශයෙන් ඇති යුතුකම් කඩකර ඇත්දැයි **විමසන්න.** (ලකුණු 06)

(b) **නිමල්ට** ලැබිය යුතු මුදල් අය කර ගැනීම සම්බන්ධයෙන් ඔහුට ඇති නීතිමය අයිතිවාසිකම් **විමසන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| දැනුම (1) | තොරතුරු සහ මූලික සංකල්ප ආවර්ජනය කිරීම | අඳින්න | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | | සම්බන්ධ කරන්න | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාව තහවුරු කිරීම. |
| | | සඳහන් කරන්න | ස්ථිර ලෙස හෝ පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | | හඳුනා දක්වන්න | සැලකිලිමත්වීමෙන් පසුව හඳුනා ගැනීම, තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | | ලැයිස්තුගත කරන්න | විස්තර කිරීමකින් තොරව සම්බන්ධිත අයිතම ලිවීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| අවබෝධය (2) | අදහස් හා තොරතුරු පැහැදිලි කිරීම. | හඳුනාගන්න | අත්දැකීම් හෝ දැනුම භාවිතයෙන් වලංගුබව හෝ වෙනත් ආකාරයෙන් පෙන්වීම. |
| | | අර්ථකතනය කරන්න | වටහාගත හැකි හෝ හුරුපුරුදු පදවලට පරිවර්තනය කරන්න. |
| | | විස්තර කරන්න | ප්‍රධාන ලක්ෂණ ලියා සන්නිවේදනය කරන්න. |
| | | පැහැදිලි කරන්න | අදාල කරුණු භාවිත කර පැහැදිලි විස්තරයක් කිරීම. |
| | | නිර්වචනය කරන්න | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| භාවිතය (3) | අළුත් තත්ත්වයන් තුළ දැනුම භාවිත කර ගැලපීම. | සසඳන්න | තවත් එකක් සමග අනුගත / අනුරූප කරන්න. |
| | | ප්‍රස්තාර දක්වන්න | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | | තක්සේරු කරන්න | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | | විසඳන්න | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |
| | | පිළියෙල කරන්න | විශේෂ අරමුණ සඳහා යමක් කිරීම හෝ සූදානම් වීම. |
| | | ප්‍රදර්ශනය කරන්න | උදාහරණ සමග ඔප්පු කිරීම හෝ ප්‍රදර්ශනය කිරීම. |
| | | ගණනය කරන්න | ගණිතමය ගණනය කිරීම මගින් සොයා දැනගැනීම හෝ ගණන් ගැනීම. |
| | | භාවිත කරන්න | ප්‍රයෝගිකව භාවිතයේ යෙදෙන්න. |

| නිපුණතා මට්ටම | විස්තරය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචනය |
|---|---|---|---|
| විශ්ලේෂණය (4) | අදහස් අතර සම්බන්ධතා ගොඩනගා ප්‍රශ්න විසදීම. | සන්නිවේදනය කරන්න | තොරතුරු බෙදාහදා ගැනීම හෝ හුවමාරු කර ගැනීම. |
| | | සැකිල්ලක් සේ දක්වන්න | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |
| | | අසමානතා බලන්න | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | සමානකම් බලන්න | සමානකම් සොයාගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | | විමසන්න | තර්ක මගින් සවිස්තර ලෙස පරීක්ෂා කිරීම. |
| | | වෙනස්කොට දක්වන්න | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | | විශ්ලේෂණය කරන්න | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |